# රබර් වගාව සමග අතුරු භෝගයක් වශයෙන් කුරුඳු වගා කල හැකිද?

**පර්සි සිල්වා**

අද ශ්‍රී ලංකාවේ රබර් වගා කල ඉඩම් වලින් 70% ක් පමණ සතුව ඇත්තේ 1,50,000 පමණ වන කුඩා රබර් වතු හිමියන්ටය. ඉන් වැඩිම දෙනා අක්කර 5 ට අඩු ඉඩම් හිමියෝය. මොවුන්ගෙන් බොහොම යක්ම ෆෙනා රබර් වගාව ජීවනෝපාය වශයෙන් කර ගෙන යති. එබැවින් යම්කිසි ක්‍රමයකින් තමන්ට රබර් වලින් ලැබෙන ආදයම් මට්ටම පහල වැටුනහොත් රබර් කර්මාන්තයට ඉතා විශාල තර්ජනයකට මුහුණ දීමට සිදුවනු ඇත.

ලංකාවේ ප්‍රධාන වගා 3න් එකක් හැටියට රබර් වගාව හැඳින්විය හැකිය. නමුත් මෑතකාලයේදී රබර් වගා කිරීමේ වේගය අඩුවූ බව පොනෙන්නට ඇත. මෙයට හේතු රාශියකි. ප්‍රධානම හේතුව වූයේ ලෝක වෙළඳ පොළේ රබර් මිල ඉහළ නොයෑමත්, නිෂ්පාදන මිළ ඉහළ යෑම නිසාත්ය. දෙවැනි හේතුව වූයේ ලංකාවේ පවතින වෙනස්වන කාලගුණ තත්ත්වයන් නිසා වර්ෂා කාලයේදී රබර් කපා ගැනීමට නොහැකිවීමත්ය. තවද සමහරෙක් තමන්ගේරබර් ඉඩම් දේපල වෙළඳාම් වලට ඉතා ඉහල මිල ගණන් වලට විකිනීමටද පටන් ගෙන ඇත. කිරි කැපීම වෘත්තියක් වශයෙන් කිරීමට අකමැති නිසා, පුහුණු කිරි කපන්නන්ගේ හිඟයක් ද පවතී. එබැවින් දනට පවතින රබර් ඉඩම් වලින් උපරිම ආදයම් සෙවීමේ මාර්ග පිළියෙල කල යුතුව ඇත.

රබර් ගස සිටුවා අස්වැන්න නෙලීමට අඩුම වශයෙන් අවුරුදු 5 ක හෝ 6 ක කාලයක් ගත වේ. මේ අතර කාලයේදී ආදයමක් ලබාගැනීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් රබර් අතර අතුරු භෝග සිටුවීමට නිර්දේශ කර ඇත. මෙයින් ප්‍රධානම භෝග නම් කෙසෙල්, අන්නාසි, පැෂන් සහ එළවළු යනාදියයි. එහෙත් මේවායින් ලැබෙන ආදයම මුල් අවුරුදු 3න් පසු (රබර් ගස වැඩෙන විට) අඩු වෙයි.

රබර් වගා කරන බොහෝ ප්‍රදේශ වල දේශගුණය පහත රට තේ වගාවටද සුදුසුය. එහෙත්, රබර් වගා කෙරෙන සෑම ඉඩමකම තේ වගාව කළ නොහැකිය. නව ව්‍යාපෘතියක් වශයෙන් රබර් ඉඩම් හිමියන්ගේ ආදයම් මට්ටම ඉහල දමීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් පස් සමීක්ෂණයන්ගෙන් පසු සුදුසු රබර් ඉඩම් හි රබර් සමඟ තේ වගාවද ආරම්භ කර ඇත. මෙය තවම පර්යේෂණ මට්ටමකින් කරගෙන යන හෙයින් මෙය පිළිබඳ තොරතුරු දනට ප්‍රකාශ නොකරනු ඇත.

ශ්‍රීලංකාවේ දකුණු හා බස්නාහිර පලාත්වල සමහර ප්‍රදේශවල ප්‍රධාන වගාව ලෙස කුරුඳු වගාව දනට කරගෙන යයි. විශේෂයෙන් මේ දිනවල කුරුඳු වලට හොඳ ඉල්ලුමක්ද ඇත. කුරුඳු කිලෝවක් දනට (1992) රු. 200! පමණ වනු ඇත. අක්කරයකින් සාමාන්‍යයෙන් අවුරුද්දකට කුරුඳු කිලෝ ග්‍රෑම් 300 ක් 400 ක් අතර ප්‍රමාණයක් ලබා ගත හැක. කුරුඳු වගාවට වැඩි වියදමක් ද දරිය යුතු නැත. රබර් වගා කෙරෙන බොහෝ ඉඩම්හි කුරුඳුද වගා කල හැකිය. සිටුවා අවුරුදු 3ක් පමණ කාලයකින් අස්වැන්න නෙලාගත හැකිය. තේ වගාව මෙන් කුරුඳු ද රබර් වගා කරන දේශ ගුණයන්හි හොඳට වැඩේ. එහෙත් කුරුඳු හිරු එළියට වැඩි කැමැත්තක් දක්වන හෙයින් වැඩි අස්වනු සඳහා අධික වර්ෂාව හෝ කළුවර අහිතකරයි. දනටමත් දකුණු පලාතෙහි කුඩා රබර් වතු හිමියන් තමන්ගේ කුරුඳු ඉඩම් වල කුරුඳු සමඟ රබර් වගා කර ඇත. කුරුඳු පොතු අලෙවියෙන් ඔවුන්ට අවුරුද්දකදී අක්කරයකින් ලැබෙන ආදයම රු. 60,000 ක් පමණ වන බව පැවසේ. දන් ලෝක වෙළඳ පොළේ හොඳ වර්ගයේ කුරුඳු තෙල් කිලෝවක් රු. 14,000 ක් පමණ වනු ඇත. කුරුඳු තෙල්, පොත්තෙන් සහ කොල වලින් ලබා ගත හැකි අතර, කොල අලෙවියෙන්ද අමතර ආදයමක් ලබාගත හැක.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ උපයෝගීතා පරීක්ෂණ අංශය 1989 අවුරුද්දේ දකුණු පළාතේ ඉඳුරුව, හබුරුගල, ගාල්ල, කඹුරුපිටිය යන ප්‍රදේශ යන්හි කුරුඳු සමඟ රබර් වගාව පිළිබඳ පර්යේෂණ ආරම්භ කර ඇත. මෙය දිගටම මෙම තත්ත්වයෙන් පැවතියහොත් මෙම වැඩපිළිවෙල අනිකුත් රබර් වගා කෙරෙන දිස්ත්‍රික්ක වලට ද ප්‍රචලිත කිරීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය බලාපොරොත්තු වෙයි.

එහෙත් රබර් වගාවට අවුරුදු 5 වනවිට හිරු එළිය අඩුවීම නිසා කුරුඳු වගාවට බලපෑම් ඇතිවීමට ඉඩ ඇත. මීට අමතරව වගා දෙකටම බලපාන වෙනත් බාධක තිබේදැයි යන්න සොයා බැලීමද අවශ්‍යව ඇත. කුරුඳු අතුරු භෝගයක් වශයෙන් වගා කිරීමේදී රබර් පැල අතර පරතරය සහ වගාකල යුතු පැල වර්ගයේම ප්‍රමාණයන් පිළිබඳවද පර්යේෂණ කළයුතුව ඇත. එබැවින් මෙම ව්‍යාපෘතියෙන් සාර්ථක ප්‍රතිඵල ලැබුනහොත් කුඩා රබර් වතු හිමියන්ට අවුරුද්දකට අක්කරයකින් රු. 40,000= 60,000! අතර ප්‍රමාණයක් අමතර ආදායමක් වශයෙන් ලබාගත හැක.

රබර් සමඟ අතුරු භෝගයක් වශයෙන් කුරුඳු වැවීම කරගෙන යෑමට හැකිද යන්න රබර් පර්යේෂණායතනය විසින් දැනට කරගෙන යන පර්යේෂණ වලින් යථා කාලයේදී දැන ගැනීමට හැකිවනු ඇත.

